Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman
Kodituwakku

**QLD**
Ananada
Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala
Sobhitha Thero
Sri Lanka Perth
Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## අන්තෝ ජටා බහි ජටා

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කතාව නැවතත් මහා පරිමාණයෙන් කතා බහට පාත්‍ර වෙමින් ඇත. ජිනීවා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුනසිල සැසි වාරයේ දී ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක ඉදිරිපත් කිරීමට ඇමරිකා එක්සත් ජනපදය ලකලෑහැස්ති වන්නේය යන කාරණය ඉස්මතු කරගනිමින් රට පුරා ඇමරිකන් විරෝධයක් ද ඇවිලෙමින් තිබෙයි. ඒ විරෝධය විදහාපාන පෙළපාලි ද රට පුරා පැවැත්වෙයි.

වේදිකාව මත රංගනය මෙසෙ සිදුවෙද්දී ආසියා කළාපයේ ත්‍රස්තවාදී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා ඇමරිකානු විශේෂ බලකායේ භටයන් පිරිසක් ශ්‍රී ලංකාවේ ස්ථානගත කර ඇති බව ඇමරිකාවම කියයි. ඒ කතාව ඇත්තදැයි හමුදා ප්‍රකාශකයාගෙන් ඇසූ විට ඔහු යන්නෙ කොහෙද මල්ලෙ පොල් වැනි පිළිතුරක් දෙයි. ඔහු කියන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධ කටයුත්තකට වෙනත් රටක කිසිදු හමුදා පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ නැතැයි කියා ය. මේ සිදුවන කරුණු කාරණා අපට මතුපිටින් පෙනෙන ආකාරයේ දේ නොවන බව නම් පැහැදිළි ය.

අනෙක් අතින් යම්හෙයකින් ඇමරිකාව ශ්‍රී ලංකා විරෝධී යෝජනාවක් ඉහත කී සමුළුවට ගෙන ආවොත් එය පරාජය කිරීම සඳහා ශ්‍රී ලංකාවට සහය වන බව චීනය කියයි. ඒ සහය වෙනුවෙන් ගෙවන්නට යම් මිලක් නියම වනු ඇති බව ද සත්‍යයකි. දැනටමත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති වලින් සියයට හැත්තෑපහකට වඩා ඩැහැගෙන සිටින චීනයට ඉදිරියේදී තව තවත් දොළ පිදේනි දෙන්නට සිදුවනු ඇත.

මේ සියළු අලකලංචි වල අයහපත් ප්‍රතිඵලය අවසන වැටෙන්නේ මහජනතාවගේ සාක්කුවලටම ය. රජය ලෝක බැංකුවෙන් විශාල ණය කුට්ටියක් ලබා ගත්තේ ලෝක බැංකුවේ ප්‍රධාන ඉල්ලීමක් වූ ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ලාබ ලබන ආයතනයක් බවට පත් කළ යුතුය කියන කොන්දේසියට එකඟ වෙමින් යයි දැන් දැන් ඇසෙයි. ලෝක තෙල් මිල ඉහළ යනනේයයි කියමින් ඉතිහාසයේ සිදුකළ විශාලම තෙල් මිල වැඩිකිරීම කරන්නට රජයට සිදුවන්නේ එනිසා ය. කිසිදු ලක ලෑස්තියකින් තොරව නින්දෙන් අවදිවූවා සේ කළ මේ මිල වැඩිකිරීමෙන් අවසානයේ අහිංසකයකුට වෙඩි කා අවසන් ගමන් යන්නට සිදුවිය. තෙල් මිල වැඩිකිරීමෙන් සිදුවූ අහයපත් බලපෑම් වලට පිළියම් යොදන්නට රජයට සිහිපත් වන්නේ එවිට ය.

සියල්ල අවුලෙන් අවුලට යමින් තිබෙයි. රජය ඉතා සීඝ්‍රයෙන් සතුරන් වැඩි කරගනිමින් සිටියි. සාර්ථක ලෙස යුද්ධය අවසන් කළ රජයට පශ්චාත් යුද පරිසරය නිසි ලෙස කළමණාකරණය කරගන්නට නොහැකි වීම ඛෙදවාචකයකි. රජය එය තේරුම් ගත් බවක් වත් පෙනෙන්නට නැත.

**සංස්කාකර - සන්නස**

ශ්‍රීලාල් ලියනගේ



# ජෙනරාල්ව යුද අධිකරණයට ගෙන ගිය මහින්ද ජාත්‍යන්තර යුද අධිකරණයට බය ඇයි ?

ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුවේදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කිරීමට ඇමරිකා එක්සත් ජනපදය සූදානම් වෙයි.

ඉන් දැඩි තැති ගැන්මකට ලක්වී ඇති රාජපක්ෂ බලකාය එම යෝජනාව මානව හිමිකම් සමුළුවට පැමිණීම වැළැක්වීමේ හා යම් හෙයකින් පැමිණියහොත් එය පරාජයට පත් කිරීමට පස්ස කැඩිච්ච කඩියෙක් සේ හතර හන්දි කඩාගෙන ඉබාගාතේ ඇවිදීමට පටන් ගෙන ඇත. සැබැවින්ම මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව මානව හිමිකම් සමුළුවේදී ඇමරිකා එක්සත් ජනපදය ගෙන ඒමට සූදානම් වන යෝජනා මොනවාද ? ඒවා පරාජයට පත් කිරීමේ හැකියාවක් අප සතුව තිබේද ? යන්න විමසා බැලීම ඉතාමත් කාලෝචිතය.

මේ වන විට ඉස්මතු වී ඇති කරුණු කාරණා වලට අනුව කොටි ත්‍රස්තවාදය පරාජයට පත් කිරීම උදෙසා කරන ලද අරගලයේදී සිදුවූ බව කියන මානව හිමිකම් උල්ලංඝණය කිරීම් වලට අදාළ සිද්ධීන් සමුදායක් මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් කිරීමට ඇමරිකාව සූදානම් වන බව කියැවේ. එනම්, කොටි ත්‍රස්තවාදය සමූල ඝාතනය කිරීමේ අවසන් කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා ආරක්ෂක අංශ ඉවක් බවක් නැතුව යුද ප්‍රහාර එල්ල කරමින් සාමාන්‍ය දෙමළ වැසියන් ඝාතනය කළ බවට එල්ලවී ඇති චෝදනාවකි.

නමුත් මේ සියලුම චෝදනා ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රතික්ෂේප කර සිටී. අහඹු සිදුවීමක් හැරුණු කොට කිසිම අවස්ථාවක සාමාන්‍ය දෙමළ වැසියන් ඉලක්ක කරගෙන ශ්‍රී ලංකා ආරක්ෂක අංශ ප්‍රහාර එල්ල නොකළ බව කියා සිටී.

සැබැවින්ම ශ්‍රී ලාංකිකයන් වන අපත් පිළිගන්නා ඇත්ත කතාව එයයි. ආරක්ෂක අංශ වලට අවශ්‍ය වුණේ කොටි ත්‍රස්තවාදය විනාශ කිරීම මිස සාමාන්‍ය දෙමළ වැසියන් සංහාරය කිරීම නොවේ. එහිදී යම් යම් අත් වැරදීම් හා ආත්මාරක්ෂාව උදෙසා එල්ල කළ ආරක්ෂක ප්‍රහාර හැර කිසිදු අවස්ථාවක සාමාන්‍ය දෙමළ වැසියන්ට ප්‍රහාර එල්ල කර ඔවුන් විනාශ කර දැමීමේ කිසිදු අවශ්‍යතාවක් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවට තිබුණේ නැත.

පිස්සු බල්ලන්සේ ඉවක් බවක් නැතුව මරු විකල්ලෙන් තමන්ගේ ජාතිමාමක දෙමළ පුරවැසියන්ටත්, ඔවුන්ගේ දේපල වලටත්, ආරක්ෂක අංශ වලටත් සීමාව අභිබවා යුද ප්‍රහාර එල්ල කරමින් මහා විනාශයකට මුල පුරවමින් මානව හිමිකම් උල්ලංඝණය කළේ වෙන කව්රුවත් නොව, කොටි ත්‍රස්තවාදීන්ය.

ශ්‍රී ලංකා ආණ්ඩුවට එරෙහිව යෝජනා ගෙන ඒමට සූදානම් වන අය ඒ බව සිහි තබා ගැනීම ඉතා වැදගත්ය. එබැවින් යම්කිසි යෝජනාවක් මානව හිමිකම් සමුළුවට ඇමරිකාව හෝ වෙනත් රටක් ගෙන ඒමට සූදානම් වනවා නම්, එය ගෙන ආ යුතු වන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුවට එරෙහිව නොව, කොටි ත්‍රස්තවාදී ම්ලේච්ඡයන්ට එරෙහිවය.

මරණ තරමක් මිනිසුන් මැරුවේ ඔවුන්ය. පන්සල්, පල්ලි, කෝවිල් වලට ආයුධ සන්නද්ධව කඩා වැදී සිංහල, දෙමළ, මුස්ලිම් වැසියන් බුරුතු පිටින් කපා කොටා මරා දැමුවේ ඔවුන්ය.

බස්රථවල හා මහජනතාව වැඩිපුර ගැවසෙන ස්ථාන වල බෝම්බ අටවා මිනිසුන් දුසිම් ගණන් සමූල ඝාතනය කරමින් රටම ලේ විලක් බවට පත් කළේ කොටි ත්‍රස්තවාදීන්ය. සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සාමයේ ගමන් මගට අවහිර බාධා පමුණු වමින් රට අරාජිකත්වයට පත් කරමින් මිනිසුන් විනාශ මුඛය කරා ඇදගෙන ගියේ කොටි ත්‍රස්තවාදීන්ය.

එසේ නම්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝණය කර ඇත්තේ කව්ද ? යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණයට රැගෙන යා යුත්තේ කව්ද? යන්න මින් පසක් වන කරුණකි.

සැබැවින්ම යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය රාජ්‍ය නායකයෙකු හෝ ආරක්ෂක

4 වන පිටට